**හානිපූරණය සඳහා වන කාර්යාලය**

**නිවේදනය**

2019 පාස්කු ප්‍රහාරයේ වින්දිතයන් සඳහා වන අරමුදලට දායකත්වය ලබා දීම සඳහා වන ආරාධනය

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ SCFR අංක 163/2019, 165/2019, 166/2019, 184/2019, 188/2019, 191/2019, 193/2019, 195/2019, 196/2019, 197/2019, 198/2019 සහ 293/2019 දරණ නඩුවල තීන්දුව අනුව පහත සඳහන් පියවර ගැනීමට මෙම කාර්යාලය වෙත නියෝග කරන ලදී. එනම්-

අ) 2019 අප්‍රේල් 21 දින සිදු වූ බෝම්බ ප්‍රහාරයෙන් පීඩාවට පත් වින්දිතයන් සහ පවුල් සඳහා වන්දි ලබා දීමට වින්දිතයන් සඳහා වන අරමුදලක් ස්ථාපිත කිරීම; සහ

ආ) වින්දිතයන්හට වන්දි ලබා දීම සඳහා සාධාරණ සහ අපක්ෂපාතී වන්දි යෝජනා ක්‍රමයක් සකස් කිරීම; සහ

ඇ) කැමති ඕනෑම පරිත්‍යාගශීලීන් සහ දායකයන්හට මෙම අරමුදලට මුදල් පරිත්‍යාග කිරීමට ආරාධනා කිරීම.

හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් මේ සඳහා අරමුදලක් ස්ථාපිත කර ඇත. එකී අරමුදලට ලැබෙන මුදල්, වන්දි වශයෙන් ප්‍රදානය කිරීම සඳහා වන්දි යෝජනා ක්‍රමයක් දැනට සකස් කරමින් පවතී. එය අවසන් වූ වහාම, මෙම කාර්යාලයේ වෙබ්අඩවිය වන www.reparations.gov.lk හි එය පළ කරනු ඇත-

ඒ අනුව, එකී අරමුදලට දායකත්වය ලබා දීමට කැමති පුද්ගලයින් තම පරිත්‍යාග පහත බැංකු ගිණුමට බැර කරන ලෙස ඉල්ලා සිටී-

**පාස්කු ප්‍රහාරය අප්‍රේල් 2019 - වින්දිතයන් සඳහා වන අරමුදල**
ජංගම ගිණුම් අංක. 0090167960
ලංකා බැංකුව, රාජගිරිය ශාඛාව
608/1, නාවල පාර, රාජගිරිය

සභාපතිනිය
හානිපූරණය සඳහා වන කාර්යාලය
අංක 40, බුත්ගමුව පාර
රාජගිරිය
2023 ජනවාරි 29